ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2288/24 - 2022 ජූලි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ජනාධිපති විසින් කාලයෙන් කාලයට සංශෝධිත, 2022 මැයි මස 27 දිනැති අංක 2281/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, 2022 ජූලි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලබයි.

**රනිල් වික්‍රමසිංහ,**
අග්‍රාමාත්‍ය,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37(1) ව්‍යවස්ථාව ප්‍රකාරව
ජනාධිපතිතුමා විසින් කරන ලද පත්කිරීමට අනුව.

2022 ජූලි මස 14 වැනි දින,
කොළඹ දී ය.

1A - G 37075 — 366 (2022/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

**01. ආරක්ෂක අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.<br>4. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.<br>5. අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම.<br>6. රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් පවත්වාගෙන යාම.<br>7. ආගන්තුක හමුදාවන් හා සබඳතා පවත්වාගෙන යාම.<br>8. ජාත්‍යන්තර මානුෂීය මෙහෙයුම් සඳහා සහයෝගය ලබා දීම.<br>9. පුපුරණ ද්‍රව්‍ය හා ගිනිඅවි පිළිබඳ කටයුතු<br>10. ප්‍රදීපාගාර නඩත්තුවට අදාළ කටයුතු (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාර හැර)<br>11. ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබා දීම.<br>12. ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම | 1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය<br>2. ශ්‍රී ලංකා යුධ හමුදාව<br>3. ශ්‍රී ලංකා නාවික හමුදාව<br>4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>5. රාජ්‍ය බුද්ධි සේවාව<br>6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>7. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව<br>8. ජාතික ශිෂ්‍යභට බලකාය<br>9. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය<br>10. සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br>11. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය<br>12. මිලෝදා ආයතනය- කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස<br>13. ආරක්ෂක සේවා විද්‍යාලය<br>14. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය<br>15. ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය<br>16. ජාතික ආරක්ෂක විද්‍යායතනය<br>17. රක්නා ආරක්ෂණ ලංකා සමාගම<br>18. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව<br>19. අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය<br>20. ජාතික ආරක්ෂක අරමුදල<br>21. රණවිරු සේවා අධිකාරිය<br>22. අපි වෙනුවෙන් අපි අරමුදල<br>23. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>24. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>25. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව | ■ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත (2009 අංක 35)<br>■ යුධ හමුදා පනත (1949 අංක 17)<br>■ නාවික හමුදා පනත (1950 අංක 34)<br>■ ගුවන් හමුදා පනත (1949 අංක 41)<br>■ උදර්පණ නීතිය (1977 අංක 8)<br>■ පුපුරණ ද්‍රව්‍ය පනත (1956 අංක 21)<br>■ ගිනි අවි ආඥාපනත (1916 අංක 33)<br>■ වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත (1951 අංක 24)<br>■ උපයෝගීතා හා පරිපූරක පනත (1985 අංක 40)<br>■ පීඩාකාරී අවි පනත (1966 අංක 18)<br>■ මුහුදු කොල්ලකෑම් පනත (2001 අංක 9)<br>■ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක 48)<br>■ මහජන ආරක්ෂක ආඥාපනත (1947 අංක 25)<br>■ රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත (2007 අංක 58)<br>■ ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත (1981 අංක 68)<br>■ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5)<br>■ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ පනත (1999 අංක 11)<br>■ සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමේ පනත (2000 අංක 42)<br>■ පෞද්ගලික ආරක්ෂක නියෝජිතායතන පනත (1998 අංක 45)<br>■ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත (2009 අංක 41) මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1) |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

01. ආරක්ෂක අමාත්‍ය (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 13. පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු<br>14. ගලවාගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම<br>15. උද්ඝෝෂණයට අදාළ කටයුතු<br>16. අන්තරාකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය<br>17. වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳ කටයුතු<br>18. ආගමන හා විගමන කටයුතු<br>19. කාලගුණය හා දේශගුණය පිළිබඳ සේවාවන් සැපයීම<br>20. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම<br>21. නායයෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම<br>22. ස්වභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම<br>23. ස්වභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම<br>24. ස්වභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසනවලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම<br>25. ස්වභාවික ව්‍යසනවලට ඔරොත්තු දෙන පරිදි (ප්‍රත්‍යස්ථ) ඉදිකිරීම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම<br>26. නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම<br>27. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු | 26. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br>27. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය<br>28. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>29. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ අනුබද්ධිත ආයතන<br>30. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන<br>31. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය<br>32. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන<br>33. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවේට් ලිමිටඩ්<br>34. ටෙක්නෝ පාක් ඩිවෙලොප්මන්ට් කම්පැනි ප්‍රයිවේට් ලිමිටඩ්<br>35. තොරතුරු තාක්ෂණ උද්‍යාන (යාපනය සහ මන්නාරම)<br>36. කාර්මික තාක්ෂණ ආයතනය<br>37. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවේට් ලිමිටඩ්<br>38. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>39. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉයෝටෙක්නොලොජි ප්‍රයිවේට් ලිමිටඩ්<br>40. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව<br>41. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>42. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව | ▪ ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)<br>▪ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)<br>▪ රණවිරු සේවා අධිකාරිය පනත (1999 අංක 54)<br>▪ අපි වෙනුවෙන් අපි අරමුදල පනත (2008 අංක 6)<br>▪ ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>▪ පුරවැසි පනත (1948 අංක 18)<br>▪ ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>▪ අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)<br>▪ අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>▪ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)<br>▪ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)<br>▪ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)<br>▪ ඉලෙක්ට්‍රෝනික් ගනුදෙනු පනත (2006 අංක 19)<br>▪ විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත ( 1994 අංක 11)<br>▪ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)<br>▪ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)<br>▪ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)<br>▪ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11) |

උපලේඛනය (*සම්බන්ධිතයි*)

01. ආරක්ෂක අමාත්‍ය (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම<br>28. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>29. අන්තර් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම තුළින් රජයේ සේවා සැපයීමේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භන සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.<br>30. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.<br>31. සමාජයේ සියළුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමඟ හවුල් වී තොරතුරු තාක්ෂණ මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.<br>32. සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැලැක්වීම.<br>33. ඩිජිටල් ව්‍යෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබා දීම.<br>34. තාක්ෂණ උද්‍යාන ඇති කිරීම.<br>35. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු<br>36. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු<br>37. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු<br>38. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය ඍජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම | | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

01. ආරක්ෂක අමාත්‍ය (*සම්බන්ධිතයි*)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 39. කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය | | |
| 40. ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය | | |
| 41. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 42. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

EOG 07 - 0070

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.